# ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග පද්ධති අවශ්‍යතාව පිළිබඳ සමාජවිද්‍යාත්මක අධ්‍යයනයක් (දියගම නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ආශ්‍රයෙන්)

ඩී.එම්.එස්.එම්. දිසානායක- සමාජවිද්‍යා අධ්‍යයනාංශය

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට අධිවේගී මාර්ග පද්ධතියේ අවශ්‍යතාව හා එමඟින් රජය අපේක්ෂා කරනු ලබන ප්‍රතිඵල කොතරම් දුරට ළඟා කර ගන්නේ ද යන්න පිළිබඳව විවිධ ක්ෂේත්‍රවල අවධානයට ලක්ව ඇත. පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග පද්ධතියේ අවශ්‍යතාව පිළිබඳ පවතින මතවාද සමාජවිද්‍යාත්මකව අධ්‍යයනය කිරීමයි. පර්යේෂණ ක්‍රමවේදය යටතේ ක්ෂේත්‍රය වශයෙන් දක්ෂිණ ලංකා අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ අනුව්‍යාපෘතියක් වූ දියගම නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය තෝරා ගන්නා ලදී. නියැදිය අධිවේගී මාර්ගයෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් දස දෙනෙකුගෙන් හා බලධාරීන් පස් දෙනෙකුගෙන් යුතු විය. දත්ත රැස් කිරීමේ ක්‍රමශිල්ප වශයෙන් සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා යොදා ගෙන ඇත. දත්ත විශ්ලේෂණය සිදු කොට ඇත්තේ ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය මඟින් ය. අධිවේගී මාර්ගයේ ආර්ථික බලපෑම, සමාජ බලපෑම හා පාරිසරික බලපෑම සම්බන්ධව බලපෑමට ලක් වූ කණ්ඩායමෙහි හා බලධාරීන්ගේ මතවාද අතර ගැටීමක් හඳුනා ගත හැකි විය. ආර්ථිකය නගාසිටුවීමට රටකට අධිවේගී මාර්ග පද්ධතියක් තිබීම වටිනා ආයෝජනයක් බවත්, සමාජයීය වශයෙන් යම් පිරිසකට සිය පදිංචි ස්ථාන අහිමි වුව ද නැවත පදිංචි කිරීම් හා වන්දි ලබාදීම් සාධාරණව සිදුකර ඇති බවත්, පාරිසරික බලපෑම වුව ද ඉතාමත් අවම වශයෙන් සිදුවන පරිදි ඉදිකිරීම් කටයුතු සිදු කළ බව බලධාරීන්ගේ අදහස විය. එහෙත් බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ අදහස් අනුව රටේ පිරිසකගේ පහසුව උදෙසා ඔවුන්ට අපහසුවෙන් ගොඩනගා ගත් ආදායම් මාර්ග අහිමි වී ඇත. සමාජයීය වශයෙන් ගත්ත ද ඥාතීන්ගෙන් දුරස් වීම, දරුවන්ගේ පාසල් මාරු වීම, නැවත පදිංචි ස්ථානවල පරිසරය ආදී බොහෝ දෑ සෘණාත්මකව බලපා ඇත. පාරිසරික බලපෑම ගත්විට වගාබිම් විශාල වශයෙන් හානි වී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ අධිවේගී මාර්ග පද්ධතියෙහි අවශ්‍යතාව සම්බන්ධව වාද විෂයක් ගොඩනැගී ඇති බවට දත්ත මඟින් හඳුනාගත හැකි විය. මෙවැනි සංවර්ධන ව්‍යාපෘතිවල දී විශේෂයෙන් ම බලපෑමට ලක් වන කණ්ඩායමට සිදුවන බලපෑම් කෙරේ බලධාරීන් වඩාත් සැලකිලිමත් විය යුතු බව පර්යේෂණයෙන් පැහැදිලි විය.

***ප්‍රමුඛ පදඃ*** *සමාජ වාද විෂය, සංවර්ධනය, අධිවේගී මාර්ග ව්‍යාපෘතිය, සමාජ බලපෑම*